1928 දී පී.එම්. ජයතිලක මහතා 111 ලබාගත් අයුරු

සෙන්පති හෙන්ඩ්‍රි ස්ටීල් ඕල්කොට්තුමා ප්‍රමුඛ පරම විඥාර්ථ බෞද්ධ සමාගම මගින් 1896 නොවැම්බර් මස පළමු වැනි දින දී කොළඹ පිටකොටුවේ මැලිබන් වීදියේ 'බුඩිස්ට් ඇකඩමි' නමින් ඉංග්‍රීසි බෞද්ධ පාසලක් ආරම්භ කරන ලදී. ආරම්භයේ දී මෙම පාසලේ සිසුන් ගණන වූයේ 38කි. සිසුන් ගණන වැඩි වී ඉඩකඩ මදි වීම නිසා මෙම පාසල වර්ථමානයේ ආනන්ද විදුහල පවතින භූමිය වෙත ගෙන යන ලදී. 1920 ගණන් වලදී මෙම පාසලද සිසුන්ගෙන් පිරී ඉතිරී යන්නට පටන් ගත්තේය. දුර දක්නා නුවනකින් යුත් අධ්‍යාපනඥයෙක් වූ පරමාදර්ශී සිංහල බෞද්ධ නායකයෙකු වූ පී. ද ඇස් කුලරත්න මැතිතුමාගේ මූලිකත්වයෙන් 1922 මාර්තු මස 31 වන දින වත්මන් නාලන්දා භූමියේ ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම ආරම්භ විය. 1923 ජනවාරි මස 20වන දිනදී එවකට කොළඹ පුරපති තැන්පත් ටි. රීඩ් මහතා මෙම පාසල් ගොඩනැගිලි විවෘත කරන ලදී. මෙම පාසල ආනන්දයේම කොටසක් ලෙස වූ අතර මුල් විදුහල්පතිවරයා වූයේ එල්.එච්. මෙත්තානන්ද මහතාය. 1925 දී මෙම පාසල වෙනමම පාසලක් වශයෙන් 'නාලන්දා' නාමයෙන් යුතුව රජයේ ලියාපදිංචි කරන ලදී. නාලන්දා නාමයත් ''ආපදාන සෝභිනී පඤ්ඤා'' පාඨයත් යෝජනා කරනු ලැබුවේ අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රී මහා ස්වාමි පාදයන් විසිනි.

ආනන්ද නාලන්ද ''සුලෝහිත සංග්‍රාමය'' ආරම්භ වූයේ 1926 වසරේය. මුල් වකවානුවේ දී මෙම තරඟ පැවැත්වූයේ වත්මන් නාලන්දා ක්‍රීඩා පිටියේය. එවකට මෙම ක්‍රීඩා පිටිය ආනන්දය සතුව තිබුනි. පොල්අතු සෙවිලි කල අලංකාර කූඩාරම් කිහිපයක් තිබුනු අතර දෙවිදුහල්වල විදුහල්පතිවරු වන පී. ද ඇස් කුලරත්න මැතිතුමාත් ගුණපාල මලලසේකර මැතිතුමාත් හා දෙපිලේම ක්‍රීඩකයින් සමග පෙනී සිටි ඡායාරූපයක් 1927 සමරු කලාපයේ පලවිය.

1928 නාලන්දා කණ්ඩායම මෙහෙය වූයේ පී.එම්. ජයතිලක මහතායි. ඒ.ටී. ද තාබෲ, ඒ. ආටිගල, සී.පී. බෝදරගම, ජී.ජී පෙරේරා සමග වයස අවුරුදු 14ක ලාබාල ක්‍රීඩක ඩී.ආර්. බෝගොල්ලාගම කණ්ඩායමට ඇතුලත් විය. මෙම කණ්ඩායම ආනන්ද කණ්ඩායමට වඩා ප්‍රබල බව සෑම කෙනෙක්ම පසක් කලේය. වොලී වනසිංහගේ නායකත්වය යටතේ එම්. ගුණසිංහ, එස්. ආටිගල, එච්.පී. යටවර හා බුද්ධදාස යන ක්‍රීඩකයින් ආනන්ද පිල වෙනුවෙන් ක්‍රීඩා කලේය.

ආනන්ද නාලන්ද සුලෝහිත සංග්‍රාමයේ කථානායකයෙකු වන ටී.එම්. ජයතිලක මහතා පසු කලෙක ඉසබාගමුව මධ්‍ය මහා විද්‍යාලයේ සහ තර්ස්ටන් විදුහලේ විදුහල්පති ලෙස අගනා සේවයක් ඉටු කලේය. 1928 දී පැවැත්වූ මෙම තරගයේ දී දක්ෂ පිතිකරුවෙකු වූ හෙතෙම මුල් ඉනිමේ දි ලකුණු අටක් ලබා දැවී ගියේය. එය ඉදිරියට පැන පහරක් එල්ල කිරීමට ගොස් පන්දුව මග හැරී කඩුලු රකින්නා අතට පත් වී සැනෙකින් කඩුල්ල බිඳ දැමීමෙනි. ආනන්ද පිලේ මුල් ඉනිම එතරම් සාර්ථක වූයේ නැත.

නැවතත් මහත් බලාපොරොත්තු සහිතව පිටියට පිවිසි නාලන්දා කණ්ඩායමේ පී.එම්. දිගට හරහට පන්දුවට තැළුවේය. ලකුණු 50ක් සාර්ථකව ලබාගත් විගස දිව ආ නාලන්දාවේ ගුරු පියානන් කෙනෙකු වූ බී.සී. සේනානායක ඔහු ඇතැතිව තිබූ ''ජින්ජි බියර්'' බෝතලයෙන් උගුරු කිහිපයක් පොවා ''මුල් ඉනිමේ දී මෙන් අපරීක්ෂාකාරී අන්දමින් ක්‍රීඩා කරන්නට එපා'' යි අවවාද කර නැවත කූඩාරමට දිව ගියේය. ලකුණු 75ක් රැස්කල විටදීද මේ ආකාරයට පී.එම්ට ''ජින්ජි බියර්'' ලැබුනේය. තරගය නිමා කිරීමට නියමිතව තිබුනේ සවස 6.00ටය. වෙලාව හය ආසන්නව තිබිය දී පී.එම් නොදැවී ක්‍රීඩා කරමින් සිටියේය. ආනන්දයේ ක්‍රීඩා භාර ආචාරවරයා වූ රාජා සහබන්දු මහතා තවත් විනාඩි 10ක කාලයක් එනම් තරඟය පස්වරු 6.10තෙක් දීර්ඝ කරන බවත් එම කාලය තුලදී ලකුණු 100ක් ලබාග්ගතයි ශබ්ද විකාශන යන්ත්‍ර ආධාරයෙන් ප්‍රකාශ කලේය. දැන් වෙලාව පස්වරු 6.10යි. අවසාන පන්දු වාරයේ අවසාන පන්දුවයි පී.එම්ගේ ලකුණු ගණන 105යි අවසාන පන්දු ඕවරයේ අවසාන පන්දුවට ක්‍රීඩා පිටිය වම් දෙසින් වූ මාර ගස් උඩින් ගොස් යාබදව පිහිටි කාර්මික විදුහලේ භූමියට වැටෙන සේ හයේ පහරක් එල්ල කලේය. පී.එම්ට 111හිමි විය. මෙතුමා මිය යන තෙක්ම එම ''ජින්ජර් බියර්'' අවවාදය සතුටින් සිහිපත් කලේය.

1950 දී කාල් ඔබේසේකරයන් ලකුණු 111ක් ලබාගත්තද ඊලග පන්දුවට උඩ පන්දුවක් ලබා දෙමින් ඉනිම අවසන් කලේය. 1928 සිට මෙම වාර්ථාව බිඳ හෙලීමට දෙපිලටම නොහැකි විය. ඔවුන් එම ආසන්නයට පැමිනියද මෙම සලකුන පසුකර යාමට නොහැකි වූයේ 111 ක්‍රිකට් ක්‍රීඩාවේ අවාසනාවන්ත සලකුණක් නිසාදෝයි මට හැගේ.

1928 මෙම තරගයට සහභාගී වූ ක්‍රීඩකයින් හා ලන්ඩන් උපාධිධාරීන් බී.සී. සේනානායක හා ආනන්ද ක්‍රීඩා භාර ආචාර්යය රාජා සහබන්දු යන මහත්වරුන් මේවන විට දැයෙන් සමුගෙන අවසන්ය. එහෙත් මෙම ලිපිය කියවන එතුමන්ලාගේ දරු මුණුබුරන් වෙතොත් මෙම අතීතය ආවර්ජනා කරනු ඇත. ඒ සැමදෙනාටම මෙය උපාහාරයක් වේවා.

2010 පෙබරවාරි මස 07වන ආදී නාලන්දීය ක්‍රීඩා උළෙලේ දී මට කාල් ඔබේසේකරයන් මුණ ගැසින. ඔහුගේ ක්‍රිකට් දිවියේ බොහෝ දේවල් හා නිවුන් සොහොයුරු වැලන්ටයින් පිළිබඳවද කතා කලේ ඉමහත් සතුටකිනි.

වසර 45ක් පුරා පැවති මෙම 111 වාර්ථාව 1972 දී බන්දුල වර්ණපුරයන් විසින් ඕවල් ක්‍රීඩාංගනයේ දී බිඳ දමන ලදී. එය නොදැවී ලකුණු 118ක් ලබා ගැනීමෙනි. 1978දී ආනන්දයේ ප්‍රසන්න අමරසිංහ 126ක් හා 1999 දී තිලිණ කන්ඩම්බි 144ක් ලබා ගත්තේය. එම ශතක වාර්ථාව තවමත් නාලන්දාව සතුව ඇත. එය 1997 දී ශාන්ත කලවිටිගොඩ විසින් ලබාගත් ලකුණු 149 නිසාවෙනි.

ඉදිරි අනාගතයේ කිසියම් ක්‍රීඩකයෙකු විසින් ලකුණු 149 වාර්ථාව බිඳ දමනු ඇත. එය කවුරුන් විසින්ද? එය කවරදිනකදීද? ජීවිතයේ සැදෑ සමය ගත කරන මට එම සිදුවීම සියැසින් දැක බලා ගැනීමේ වාසනාව හිමිවේද?

ඩොල්ටන් වක්වැල්ල